# කෘෂි රසායන ද්‍රව්‍ය වලින් සිදුවන පරිසර දූෂණය

පළිබෝධ නාශකයන් අනිසි ලෙස පාවිච්චි කිරීම සහ පාලනයකින් තොර කාර්මික දූෂණයේ දී ආසියානු සහ ශාන්තිකර කලාපයේ රටවල මහජන සෞඛ්‍යය පිළිබඳ බරපතළ උවදුරකට තුඩු දී ඇති බව මෑත දී බැංකොක්හි දී නිම වූ එ.ජා.ප.වැ/'එස්කැප්' සංවිධානයේ සම්මන්ත්‍රණයක දී නිරීක්‍ෂණය කරන ලදී. ආසියා - ශාන්තිකර කලාපයේ ආර්ථික සංවර්ධනයෙන් විශාල ප්‍රමාණයක් සිදු වී ඇත්තේ ඉඩම් සහ පාරිසරික ගුණාංග කැප කිරීමෙන් බැව් පරිසර සංවර්ධන පිළිබඳ ලෝක කොමිෂන් සභාව පවසයි. මේ කලාපය තුළ පරිසර තත්ත්වය පෙන්නුම් කරන සියලු දර්ශනයන්හි දශකය අවසානය වන විට ඇත්ත වශයෙන් ම තියුණු පසු බැමක් සිදු වී තිබීමෙන් මෙය පැහැදිළි වේ.

අසල්වැසි රාජ්‍යයන් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ පරිසරය කෙරෙහි සිදු වී ඇති කාර්මික දූෂණය ඉතා සුළු වුව ද, කෘෂි කාර්මික දූෂණ - එනම්, රසායනික පොහොර සහ පළිබෝධ නාශක (කෘමි නාශක, දිලීර නාශක, වටපණු නාශක, වල් පැළෑටි නාශක) ගැන එසේ කිව නොහැකි ය. එබැවින්, විශේෂයෙන් ම අලුතෙන් මතු වී එන කාර්මික ආර්ථිකයන් තුළින් (සිංගප්පූරුව, දකුණු කොරියාව, ජපානය, මැලේසියාව, තායිලන්තය, ඉන්දුනීසියාව ආදිය) ලබන අත්දැකීම් පදනම් කොට ගෙන කර්මාන්ත වලින් ඇතිවන දූෂණය සැළකිය යුතු අන්දමින් පාලනය කරනු ලැබිය හැකි ය.

විශේෂයෙන්ම සහල් නිෂ්පාදනයට අදාළව, ශ්‍රී ලංකාවේ වගා ව්‍යාපාරය වැඩි ප්‍රමාණයක පොහොර අවශ්‍ය වන කෙටි කාලීන වී වර්ග භාවිතා කිරීමෙන් සාර්ථක කරගන්නා ලද්දකි. සාම්ප්‍රදායික වැඩිමල් වී වර්ගවලට සහ පළදාව අඩු 'එච්' වර්ගයට වඩා, 'බී ජී' සහ 'අයි ආර්' වී වර්ග ගොයම් පළිබෝධවලට සහ ගොයම් රෝගවලට බොහෝ පහසුවෙන් ගොදුරු වන බැවින්, ඉක්මන් සහ වැඩි අස්වැන්නත් ගෙන දෙන වී වර්ගවලට පළිබෝධ නාශක විශේෂයෙන් ම දිලීර නාශක සහ කෘමිනාශක අධික ප්‍රමාණයක් භාවිතා කිරීම අවශ්‍ය විය.

එළිමහන් බෝග සඳහා පොහොර භාවිතා කිරීම පිළිබඳ නියමිත ප්‍රමාණයන් අනුගමනය කිරීම ශ්‍රී ලංකාවේ අඩුවෙන් ක්‍රියාත්මක වූ අතර, මෙකී බෝග සඳහා වුවද - විශේෂයෙන්ම, පුදුමාකාර අස්වැන්නක් ගෙන දුන් මිරිස්, එළුණු, මුං ඇට, කව්පි සහ උඩරට එළවලු සඳහා පළිබෝධ නාශක භාවිතා කිරීම සැළකිය යුතු අන්දමින් අධික විය.

පළිබෝධ නාශකයන් විශේෂයෙන්ම වල් පැළෑටි නාශක, පාංශු කෘමිනාශක සහ දිලීර නාශක අක්‍රමවත් ලෙස භාවිතා කිරීම නිසා පස දැඩි ලෙස නිසරු වීමේ ප්‍රශ්න හට ගන්නා අතර, ඒ හේතුවෙන් පසේ (ක්ෂුද්‍ර ශාක සහ සත්ව යන දෙකොටසට ම අයත්) ක්ෂුද්‍ර ජීවීන් ගේ පාරිසරික තුලනය ව්‍යාකූල වී යා හැකි ය. නයිට්‍රජන් තිරකාරක බැක්ටීරියා සහ වෙනත් හිතකර ආකාරයන් වැනි හිතකර පාංශු ක්ෂුද්‍ර ජීවීන් නැතිවීම හේතු කොට ගෙන පසෙහි ගුණාත්මක භාවය අඩු වී යයි. පසට පොහොර යෙදීම පිළිබඳ නිසි පාලනයක් (උදා: අකාබනික සහ කාබනික රසායන පොහොර ප්‍රඥාගෝචර ලෙස භාවිතා කිරීම) නොමැතිවීම කරන කොට ගෙන පසේ ආකෘතිය සහ අස් වැද්දීමේ හැකියාව, ජලය රඳවා ගැනීමේ හැකියාව සහ පස දියුණුවීමේ දී ඉහළ නගින ක්ෂුද්‍ර පෝෂක ද විනාශ වී යයි.


## ආචාර්ය රාජා අමරසේකර
### ලේකම්, පාරිසරික අමාත්‍යාංශය


මෑත කාලයේ දී පළිබෝධ නාශක සහ රසායනික පොහොර අධික ලෙස පාවිච්චි කිරීම භූගත ජලය අපවිත්‍ර වීමට හේතු වී ඇති අතර, දිවයිනේ උතුරේ සහ ඊසාන දිග ඇතැම් ප්‍රදේශවල විශේෂයෙන් ම ජල එලකය පහත්ව පිහිටි රෙගසෝල් සහ ලැටසෝල් හි ජල කාඩය කෙරෙහි බලපා ඇත. මේ අනුව බලන විට බලපෑමට ගොදුරු විය හැකි කෘෂි පාරිසරික කලාපවල ජලය පරීක්ෂාවට ලක් කිරීම භූ ගත ජල ප්‍රභවයන් නියමිත සෞඛ්‍ය ප්‍රතිමානයන් ඉක්මවා අපවිත්‍ර වීමෙන් වළක්වා ලීම සඳහා අත්‍යාවශ්‍ය වේ. ජලය සහ පස අපවිත්‍රවීමට අමතරව කෘෂි රසායන ද්‍රව්‍ය හේතුකොට ගෙන මත්ස්‍යයන් සහ වෙනත් ආකාරවල ජලජ ජීවීන් ද මැරී යාම වැඩි වී ඇත. අස්වනු නෙළීමට පෙර හා පසුව ඉසිනු ලබන පළිබෝධ නාශකවලින් ආහාර වර්ග දූෂණය වූ අවස්ථා ගැන ද වාර්තා වී ඇත. පළිබෝධ නාශක විෂවීම පිළිබඳ නිතර නිතර වාර්තා වන උඩරට එළවලු වගා කෙරෙන පෙදෙස්වල මේ තත්ත්වය සැළකිය යුතු අන්දමින් වැඩි ය.

මේ අනුව සලකා බැලීමේ දී පාරිසරික සම්පත්වලට සිදුවිය හැකි හානිය බෙහෙවින් ම අඩුවන සේ කෘෂි - රසායන ද්‍රව්‍ය ඵලදායී ලෙස භාවිතා කිරීමට වග බලා ගැනීම අතිශයින් ම වැදගත් වේ. මේ අරමුණු මුදුන් පත් කර ගැනීම සඳහා ගතහැකි ක්‍රියා මාර්ගවලින් සමහරක් මෙසේ ය:-

1. පළිබෝධවලට හා රෝගවලට ඔරොත්තු දෙන අන්දමේ ශාක ජාන සම්පත් සංරක්ෂණය කිරීම සහ ඒ මගින් පළිබෝධ නාශක භාවිතය අඩු කිරීම.
2. වැඩි අස්වැන්නක් ගෙන දෙන සහ කෘතිම අකාබනික රසායන පොහොර, එතරම් අවශ්‍ය නොවන ශාක ජාන ප්‍රභවයන් සංරක්ෂණය කිරීම.
3. මේ අංශයෙහි ලා, මධ්‍යම කෘෂිකාර්මික පර්යේෂණ ආයතනයෙහි ජාන සම්පත් මධ්‍යස්ථානයක් පිහිටුවීම ඉතා ප්‍රගති ශීලී පියවරකි.
4. ශාක පළිබෝධවලට හා රෝගවලට ඔරොත්තු වීමේ ශක්තිය ඇති කිරීම් වස් ශාක ජාන වර්ගවල වෙනසක් කිරීම පිණිස ජීව තාක්ෂණය යොදා ගැනීම.
5. එමෙන් ම, අඩු වට්ටමක රසායනික පොහොර අවශ්‍ය වන්නා වූ නව ශාක ජාන දර්ශයන් තෝරා ගැනීම සඳහා ජීව තාක්ෂණය උපයෝගී කර ගැනීම.
6. කෘත්‍රිම රසායනික පොහොර යෙදීම අඩු කරනු වස්, ජෛව - ඇල්ගීය රසායනික පොහොර භාවිතය වැඩි දියුණු කිරීම සහ නයිට්‍රජන් තිරකාරක ක්‍රම භාවිතය වැඩි කිරීම.
7. ජීව විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ පළිබෝධ / රෝග පාලන ක්‍රමවල ඒකාබද්ධ පද්ධති වැනි පළිබෝධ පාලන විකල්ප (රසායනික නොවන) ක්‍රම යොදා ගනිමින් ශාක පළිබෝධ සහ රෝග නිසි ලෙස පාලනය කිරීම. ආරම්භ කළ යුතුය.
8. පාවිච්චිය ඉහළ මට්ටමකින් පවතින ප්‍රදේශවල පසෙහි සහ ජලයෙහි ඇති පළිබෝධ නාශක බොර පරීක්ෂාවට භාජනය කිරීම අනිවාර්ය බවට පත් කිරීම.
9. පොදු විය හැකි පරිසර පද්ධතීන් කෘෂි රසායන ද්‍රව්‍යවලින් අපවිත්‍රවීම හැකිතාක් දුරට අඩු කරලීම සඳහා නීතිය ක්‍රියාත්මක වීම ප්‍රබල කිරීම.
10. මිනිසාට සහ ඔහුගේ පරිසරයට කෘෂි රසායන ද්‍රව්‍යවලින් ඇති වෙන සෞඛ්‍ය උපද්‍රව - වෙසෙසින් ම ආහාර පද්ධතිය කෙරෙහි ඇතිවන බලපෑම - පිළිබඳ මහජනතාව තුළ අවබෝධයක් ඇති කිරීම.